# 11. ශුද්ධාත්මයාණන් තුළින් නවෝදයක්

**පෙන්තකොස්ත දින සිදු වූ සිද්ධිය ගැන ප්‍රේරිතයන්ගේ ක්‍රියා පොතේ සඳහන් විස්තරය සවිස්තරාත්මක ව සලකා බලා ඉන් අපගේ ජීවිතයට ලැබෙන ආලෝකය හා නවෝදය ගැන අවබෝධයක් ලබා ගැනීම මෙම පාඩමින් අපේක්ෂිත ය.**

**ක්‍රියා 2 : 1 - 13**

පෙන්තකොස්ත සිද්ධියේ අත්දැකීම ලැබූවකු තම මිතුරකුට ඒ ගැන ලිපියක් මගින් දැන්වූයේ මෙසේ ය.

ප්‍රිය මිතුර,

ඔබ දැන් ක්‍රිස්තුන් වහන්සේ වෙත හැරී ඇති බව ඇසූ මට විශාල ප්‍රීතියක් දැනුණා. ඔබ වැනි කෙනකු ක්‍රිස්තුන් වහන්සේගේ යහපත් අනුගාමිකයෙක් වීම ඇසන්නට ලැබීම පවා සතුට ගෙන දෙන්නක්.

ඔබ, එදා පෙන්තකොස්ත දින ඇති වූ සිද්ධිය ගැන මගෙන් කිහිප වරක් ම විමසුවේ ඇයිදැයි මට දැන් තේරුම් ගොස් තිබෙනවා. ඒ සිද්ධිය මගේ මුළු ජීවිතය ම සම්පූර්ණයෙන් වෙනස් කරන්නට පිටිවහලක් වුණා.

ඒ දවසේ අප සියලු දෙනා ජෙරුසලමේ එකට රැස්වී සිටි වේලාවේ මහා සුළඟක් හමන්නාක් වැනි ශබ්දයක් ඇසී අප සිටි මුළු කාමරය ම සුළඟින් පිරී ගිය බව දැනුණා. එවිට පුදුමාකාර ලෙස ගිනි දළු වැනි දිව් අප සියලු දෙනා මතට පැමිණුනා. අපි සැවො ම අන්‍ය භාෂාවලින් කථා කරන්න පටන් ගත්තා. අප ගලීලයේ ප්‍රදේශවාසීන් වුවත් අප කථා කළ භාෂා එතැන සිටි අනෙක් සහෝදර සහෝදරියන්ට ඇසුණේ ඒ අයගේ ම භාෂාවෙන්.

ඔවුන් සියලු දෙනාට අප නො දැනුවත් ව දේව බලය පිළිබඳ ව අවබෝධයක් ලැබුණා. ඉන් පසු ව මෙපමණ කාලයක් බියෙන් සැඟවී සිටි ශ්‍රාවක පේදුරුතුමා කිසි දිනක නොකළ කථාවක් නිර්භය ව කළා.

පුරාණ ගිවිසුමේ ජෝවෙල් දිවැසිවරතුමා කියූ අනාගත වාක්‍යය ඉටුවුණ බවත්, ජේසුස් වහන්සේ මරණින් උත්ථාන කරනු ලැබූ බවත්, උන් වහන්සේ දැන් ජීවමානව සිටින ස්වාමීන් වහන්සේ බවත් පේදුරුතුමා තම දේශනාවේ දී සඳහන් කළා.

පුදුමයට කරුණ නම් ඒ දවසේ දී ම තුන්දාහක් පමණ සෙනඟ ස්වාමීන් වහන්සේ පිළිගත් බව දැනගන්නට ලැබීම යි. ඉතින් මිතුර, ඔබ තුළත් ශුද්ධාත්මයාණන් වැඩ වසන බව මම විශ්වාස කරමි.

ඔබගේ ජීවිතය ශුද්ධාත්මයාණන්ගෙන් අලුත් වී, වෙනස් වී ජීවිත නවෝදයක් අත්දකින්නට ලැබේවා' යි මම ප්‍රාර්ථනා කරමි, යාච්ඤා කරමි.

මීට,

ක්‍රිස්තුන් වහන්සේ තුළ

ඔබේ හිතවත් මිතුරා

## ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආගමනය

දිනය - ජුදෙව් පාස්කු මංගල්‍යයට දවස් 50 කට පසු ව පෙන්තකොස්ත මංගල දින දී ය. මෙදින සාමාන්‍යයෙන් අස්වැන්නේ ප්‍රථම ඵල පූජා කෙරේ. පුරාණයේ සිට පැවත එන කෘෂි කාර්මික මංගල්‍යයකි.

ස්ථානය - ජෙරුසලමේ ගෙයක දී

එහි සිටි අය -අලුතින් ශ්‍රාවකයකු ලෙස තෝරාගත් මත්තියස් ඇතුළු ශ්‍රාවකයන් දොළොස් දෙනා හා විවිධ ප්‍රදේශවලින් හා රටවලින් පැමිණි, විවිධ භාෂා කථා කරන බැතිමත් ජුදෙව්වන් හා අමුත්තන්

ශ්‍රාවකයන්ගේ තත්ත්වය - ජුදෙව්වන්ට බියෙන් දොරවල් වසාගෙන සිටි කාලයකි.

# පෙන්තකොස්ත දින ශුද්ධාත්ම දානය



පෙන්තකොස්ත දින ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආගමනය සිදුවුණි. පුරාණ ගිවිසුමේ බොහෝ අවස්ථාවල එක් එක් පුද්ගලයකු මත ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණිය ද, පෙන්තකොස්ත දින, රැස්ව සිටි සියලු ශ්‍රාවකයන් වෙත ශුද්ධාත්මයාණන් වහන්සේ පහළ වුණු සේක. දැන් අපි, පෙන්තකොස්ත දින වූ සිද්ධිය එකින් එක සලකා බලමු.

## 1. සැඩ සුළඟක් හමන්නාක් වැනි හඬක්

පුරාණ ගිවිසුමේ හා අලුත් ගිවිසුමේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාකාරිත්වය සුළඟේ ක්‍රියාකාරිත්වයට උපමා කර තිබේ. සුළඟ හැමීම වැනි හඬ යන්නෙන් ඉතා බලවන්ත ලෙස ශුද්ධාත්මයාණන් වහන්සේගේ පහළ වීම විස්තර කෙරේ.

## 2. ගිනි දළු වැනි දිව්

දෙවියන් වහන්සේ ගේ වැඩ සිටීම සඳහා බයිබලයේ භාවිත වුණු තවත් සංකේතයක් නම් "ගින්න" ය. මෝසෙස් කැඳවනු ලැබුයේ ගින්නෙන් දැවී නො ගිය පඳුරක් ළඟදී ය. මිසරයේ සිට නික්මයාම ගමනේ යෙදුණ හෙබ්‍රෙව් ජනතාවට රාත්‍රි කාලයේ මඟ පෙන්වූයේ "ගිනි ටැඹ"ය. පෙන්තකොස්ත දා "ගිනි වැනි දිව්" යන්නෙන් අදහස් කරන්නේ නිර්භයව සාක්ෂි දැරීම සඳහා අවශ්‍ය බලය දෙවියන් වහන්සේ ලබා දුන් බව පෙන්වීමට ය.

## 3. ගිනි දළු වැනි දිව් රැස්ව සිටි අය මත පිහිටවනු ලැබීම

පෙන්තකොස්ත දින "ගිනි දළු වැනි දිව්" එහි රැස්ව සිටි සියලු ශ්‍රාවකයන් මත පිහිටුවනු ලැබූ බව ක්‍රියා පොත අපට පවසයි. ඉන් අදහස් කරන්නේ,ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩ සිටින හා සාක්ෂි දැරීමේ බලය යි. මෙය ශ්‍රාවකයන් වෙත ලබා දෙන ශුද්ධාත්මයාණන් වහන්සේ ඔවුන් කෙරේ පැමිණ ඔවුන් තුළ වැඩ සිටීම යි

## 4. අන්‍ය භාෂාවලින් කතා කිරීම.

ශ්‍රාවකයන් අන්‍ය භාෂාවලින් කථා කළේ ශුද්ධාත්ම බලය නිසා ය. ඔවුහු ගලීලයේ විසූ සාමාන්‍ය වැසියන් වූවත් බලයෙන් යුක්තව අන්‍ය භාෂා කථා කළහ.

## 5. ශ්‍රාවකයන් කථා කළ අන්‍ය භාෂා තමන්ගේ ම මවු බසින් අන් අයට පැහැදිලි වීම.

මින් අපට පෙනී යන්නේ ශ්‍රාවකයන් අන්‍ය භාෂාවලින් කථා කළ ද, එහි සිටි අය එය තමන්ගේ ම බසින් එය ඇසීම යි. එය ශුද්ධාත්මයාණන් ගේ තවත් බලවත් ක්‍රියාවලියකි.

## 6. දෙවියන් වහන්සේගේ බලවත් ක්‍රියා ප්‍රකාශ කිරීම.

අන්‍ය භාෂා කථා කිරීම තුළින් ශ්‍රාවකයන් ප්‍රකාශ කළේ දෙවියන් වහන්සේගේ බලවත් ක්‍රියා යි. (ක්‍රියා 2 : 11). ජේසුස් වහන්සේගේ මරණයත් සමග ශ්‍රාවකයෝ මුළු ගැන්වී සිටියහ. එදින ශුද්ධාත්ම බලය කරණකොට ගෙන දෙවියන් වහන්සේගේ බලවත් ක්‍රියා පිළිබඳ ධෛර්යයෙන් හා බලයෙන් යුක්තව ඔවහු සාක්ෂි දරනු ලැබූ හ.

## ශුද්ධාත්මයාණන් වහන්සේ වෙතින් අප ලබන සවිය හා නවෝදය

සී සී කඩ විසිර සිටි, ශ්‍රාවකයන් පෙන්තකොස්ත දා බල ගන්වනු ලැබිණි. එවිට ඔවුහු නිර්භයව දිරිමත්ව සවිමත්ව සාක්ෂි දැරූහ. එසේ ම ඔවුන්ගේ ජීවිතයට නව ජවයක්, එකමුතුකමක්, අරමුණක් සහ නවෝදයක් ලැබුණි.

අද දවසේත් ශුද්ධාත්මයාණන් වහන්සේ අප උන් වහන්සේගේ බලයෙන් පුරවන්නට බලා සිටින සේක. අපේ බිය පහකොට අප සැබෑ සාක්ෂිකරුවන් බවට උන් වහන්සේ පත් කරන සේක. එවිට අපේ ජීවිතයේ නව උදාවක් ඇති වනු ඇත. ඒ සඳහා උන්වහන්සේට අපේ ජීවිත භාර කරමු.

**ක්‍රියාකාරකම**

01. පෙන්තකොස්ත දින සිදුවීමේ අවස්ථාවන් පෙළ ගස්වන්න.

02. ශුද්ධාත්ම මගපෙන්වීම් අයදිමින් යැදුමක් ලියන්න.